# බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2018/2019
# බෞද්ධ අධ්‍යයන අංශය
# කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශය මගින් 2018/2019 අධ්‍යයන වර්ෂයේ පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MA in Buddhist Studies) සඳහා 2017 දෙසැම්බර් 30 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් බෞද්ධ අධ්‍යයන, පාලි හෝ දර්ශනය යන විෂයකින් ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය සමත්ව තිබීම.
II. ඕනෑම මූලික උපාධියක් සහිතව බෞද්ධ අධ්‍යයන විෂය සම්බන්ධ වසරක පළපුරුද්දක් තිබීම.
III. පිළිගත් විශ්වවිද්‍යාලයකින් බෞද්ධ අධ්‍යයන හෝ පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ ප්‍රාචීන අවසාන විභාගය සමත්ව තිබීම.
IV. කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**පාඨමාලා මාධ්‍යය:** සිංහල/ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය:** වර්ෂයයි
දේශන සෙනසුරාදා (රජයේ නිවාඩු දින හැර) දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයේදී පැවැත්වේ.

**පාඨමාලා ගාස්තුව -** රු 30,000.00

**වැඩිදුර තොරතුරු**
බෞද්ධ අධ්‍යයන අංශයේ පහත සඳහන් වෙබ් අඩවියෙන් හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ප්‍රකාශන අංශයෙන් (Academic & Publication Branch) පාඨමාලාවට අදාළ විස්තර පත්‍රිකාව සහ අයදුම්පත්‍ර ලබා ගත හැකිය.

http://arts.cmb.ac.lk/bst

දුරකථන අංක: 011 2055487

**අයදුම් කරන ආකාරය**
නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් යොමු අංක 304121200003 දරන කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට බැර වන සේ ගෙවන ලද රු. 500/- (අයදුම් පත්‍ර ගාස්තුව) ලදුපත ද සමඟ 2017 දෙසැම්බර් 30 දිනට පෙර කොළඹ විශ්වවිද්‍යාලයේ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. නැතහොත් ගෙනවිත් බාර දෙන්න.

**බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2018/2019**
**අධ්‍යයන හා ප්‍රකාශන අංශය**
**අංක 1490**
**කොළඹ විශ්වවිද්‍යාලය**
**කොළඹ 03**